ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## 2024-25 අධ්‍යයන සැසිය සඳහා ඉන්දියාවේ හින්දි භාෂාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව

ඉන්දීය රජයේ මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2024-2025 අධ්‍යයන සැසිය සඳහා අග්‍රා හි පිහිටි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් හි (හින්දි භාෂා මධ්‍යස්ථානය) හින්දි භාෂාව හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි. පූර්ණ ශිෂ්‍යත්වයක් වන මේ යටතේ තෝරා ගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට යාමට සහ ඒමට ගුවන් ටිකට්පත්, ශිෂ්‍යාධාර, නේවාසිකාගාර පහසුකම් සහ වාර්ෂික පොත් ප්‍රදානයක් ද ලබා දේ.

2. මූලික/අන්තර්මධ්‍ය මට්ටමෙන් හින්දි භාෂාව හදාරා ඇති වයස අවුරුදු 21-35 අතර අයවලුන්ට මෙම ශිෂ්‍යත්වය සඳහා අයදුම් කළ හැකිය. මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය පිළිබඳ වැඩිදුර විස්තර https://hcicolombo.gov.in/what. වෙබ් අඩවිය තුළින් ලබා ගත හැකිය. සුදුසුකම් ලබන ශ්‍රී ලාංකීය සිසු සිසුවියන් සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟින් 2024 පෙබරවාරි 26 වන දින පෙරවරු 10 සිට පස්වරු 01 දක්වා නො. 16/2, ග්‍රෙගරි පාර, කොළඹ 07 යන ලිපිනයේ පිහිටි ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ දී (ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය) සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

***

***කොළඹ***
***2024 ජනවාරි 16***